**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**2024 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක් විසින්, එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව ඇතුළත පහත දැක්වෙන බලපත්‍ර ගාස්තු නියම කිරීම හා අය කිරීම කරනු ලැබිය හැකිය. ඒ අනුව වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා **පනවා අය කිරීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 සැප්තැම්බර් මස 14 වන දින තීරණ අංක 2023/09/14/85 යටතේ පහත සඳහන් තීරණය කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.**

එකී වෙළඳ බලපත්‍ර ගාස්තුව 2024 වර්ෂයේ මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මඟින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තු වලට අමතරව ගෙවිය යුතු වේ.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

ප්‍රාදේශිය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මීගහකිවුල ප්‍රාදේශිය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මීගහකිවුල ප්‍රාදේශිය සභාව විසින් 2024 වර්ෂය තුල දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශිය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ ii වන තීරුවේ අනුරූපිත සටහනෙ හි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකි උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණා ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභා ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පළෙහි 2023 වර්ෂය තුල ලැබීම් වලින් සියයට එකක් (1%) විය යුතු බවට තීරණය කරමි.

# උපලේඛනය

| අනු අංකය | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු) | | |
| | බලය දෙනු ලබන කාර්යයන් | **750.00** නොඉක්මවන අවස්ථාවක<br><br>රු.ශත | **750.00** ඉක්මවන එහෙත් **1500.00** නොඉක්මවන අවස්ථාවක<br><br>රු.ශත | **1500.00** ඉක්මවන අවස්ථාවක<br><br>රු.ශත |
| 01 | පළතුරු වෙලදාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | සිල්ලර වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | එළවළු වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | සිල්ලර වෙළදාම (තොග) | 500.00 | 750.00 | 1000.00 |
| 05 | පාපැදි අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 06 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | මෝටර් රථ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ත්‍රී රෝද රථ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ලී මෝල (අතින් ඉරන ලද ලී) | 500.00 | 750.00 | 1000.00 |
| 10 | වඩු මඩුවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | විදුලි කර්මාන්ත වැඩපලවල් (ගුවන් විදු යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර) | 500.00 | 750.00 | 1000.00 |
| 12 | අනුමත ආයතන තුළ සකස් කර පැකට් කරන ලද ශීත කළ කුකුල් මස් හා මාළු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කරවල විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | බිත්තර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ග්‍රොසරි | 500.00 | 750.00 | 1000.00 |
| 16 | පුවක්,කරුංගා, ගම්මිරිස්,කෝපි මිලට ගැනීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | කැබලි රෙදි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | හම්/රෙක්සින් භාණ්ඩ නිපදවීම (සපත්තු, බෑග් හා වෙනත්) | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ශබ්ද වාහිණී යන්ත්‍ර ක්‍රියාකරවීම හා කුලියට දීම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 21 | බත් කඩ , ආපනශාලා, සහ තේ කඩ | 500.00 | 750.00 | 1000.00 |
| 22 | බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 23 | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 27 | සංචාරක වෙළඳාම(වඩේ, ටෙස්, බයිට් වර්ග, බේකරි නිෂ්පාදන) | 500.00 | 750.00 | 1000.00 |
| 28 | පොදු වෙළඳ පල | 500.00 | 750.00 | 1000.00 |
| 29 | බාබර් සාප්පු | 500.00 | 750.00 | 1000.00 |
| 30 | සුවඳ විලවුන් හෝ විෂබීජ නාශක විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | තීන්ත/වාර්නිෂ් වර්ග විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | නවාතැන් පහසුකම් සහිත ව්‍යාපාර | 500.00 | 750.00 | 1000.00 |
| 33 | පරිගණක මුද්‍රණ කටයුතු | 500.00 | 750.00 | 1000.00 |
| 34 | හාල් තොග හා සිල්ලර | 500.00 | 750.00 | 1000.00 |
| 35 | ඔරලෝසු අළුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |

සැ.යු සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් ආපනශාලා සහ ලැගුම්හල් පෙර වර්ෂයේ ලැබීම් 1% බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය.

අප්‍රසන්න ව්‍යාපාර

| අනු අංකය | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු) | | |
| | බලය දෙනු ලබන කාර්යයන් | **750.00** නොඉක්මවන අවස්ථාවක<br>රු.ශත | **750.00** ඉක්මවන එහෙත් **1500.00** නොඉක්මවන අවස්ථාවක<br>රු.ශත | **1500.00** ඉක්මවන අවස්ථාවක<br>රු.ශත |
| 36 | කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37 | ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 38 | ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39 | සත්ත්ව පාලනය (කිරි හා මස් සඳහා) | 500.00 | 750.00 | 1000.00 |
| 40 | සත්ත්ව ආහාර නිපදවිම හා විකිණිම | 500.00 | 750.00 | 1000.00 |
| 41 | ගෘහ භාණ්ඩ නිපදවිම | 500.00 | 750.00 | 1000.00 |
| 42 | වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 43 | වඩු කර්මාන්තශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 44 | ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 45 | ගඩොල් පිලිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 46 | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති, බ්ලොක්ගල් නිපදවීම හා විකිණිම | 500.00 | 750.00 | 1000.00 |
| 47 | පැල තවානක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

ප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 01 | පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | තැඹිලි, කුරුම්බා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | හුණු ගල් පිලිස්සීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කළුගල් වැඩපලක් | 500.00 | 750.00 | 1000.00 |
| 07 | රූපලාවණ්‍යාගාර | 500.00 | 750.00 | 1000.00 |
| 08 | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධි ශිතකරණ යන්ත්‍ර අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බිම්මල් වගාව හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

අන්තරාදායක ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 01 | වැල්ඩින් වැඩපල (ඔක්සි ඇසිඩ් භාවිතය) | 500.00 | 750.00 | 1000.00 |
| 02 | වැල්ඩින් වැඩපල (විදුලි භාවිතය) | 500.00 | 750.00 | 1000.00 |
| 03 | වීදුරු තහඩු කැපීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 05 | කුෂන් වැඩපල | 500.00 | 750.00 | 1000.00 |
| 06 | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 07 | ගෑස් අලෙවිය/අළෙවි නියෝජිත | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ස්වර්ණාභාරණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ගිණිකෙළි,රතිඤ්ඤා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | වීදුරු භාණ්ඩ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ග්‍රිල් ගේට්ටු සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ටින්කර් වැඩ | 500.00 | 750.00 | 1000.00 |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**2024 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීම.**

1987අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන පහත සඳහන් උප ලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බදු 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට,**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/86 දරණ පහත සඳහන් තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

එකී කර්මාන්ත බදු ගාස්තු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතුය. රජය මඟින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තු වලට අමතරව ගෙවිය යුතුය.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වන තීරුවේ, එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණය කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

# උපලේඛනය

| අනු අංකය | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තය | ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු) | | |
| | | **750.00** නොඉක්මවන අවස්ථාවක<br>රු.ශත | **750.00** ඉක්මවන එහෙත් **1500.00** නොඉක්මවන අවස්ථාවක<br>රු.ශත | **1500.00** ඉක්මවන අවස්ථාවක<br>රු.ශත |
| 01 | ගඩොල්/සිමෙන්ති ගඩොල්,බීරලු, මල් පෝච්චි, නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 02 | අයිස්ක්‍රීම් /බීම පැකට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 03 | කිරි ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 04 | මැටි භාණ්ඩ නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 05 | පාවහන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 06 | පැණි/ හකුරු නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | අත් යන්ත්‍ර මගින් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 09 | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 10 | බෑග් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ඇඳුම් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ඩිජිටල් තාක්ෂණ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | බිරළු ලී කැටයම් වැඩපලක් | 500.00 | 750.00 | 1000.00 |
| 15 | පොල්තෙල් මෝලක් | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ඡායාරූප ශාලා | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | බලවේග තේ කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | වී මෝල් | 500.00 | 750.00 | 1000.00 |
| 22 | ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | පාපැදි යතුරුපැදි අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | දේශිය බෙහෙත් වර්ග නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | මෝටර් රථ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | ඇගලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | ගල් වලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33 | ගෘහ භාණ්ඩ විසිතුරු භාණ්ඩ ආදී නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 34 | කූඩ , වට්ටි වැනි වේවැල් බට ආ ශ්‍රිත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 35 | ඉලෙක්ට්‍රික් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36 | ගරාජ් | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 37 | ලී මෝලක් | 500.00 | 750.00 | 1000.00 |
| 38 | යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39 | වායු සමීකරණ ශීතකරණ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 40 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41 | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42 | කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43 | බෑග් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 44 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 45 | රස කැවිලි නිෂාපාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 46 | වැලි ගොඩ දැමීම හෝ වැලි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 47 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48 | රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49 | වීදුරු කැපීම හා පින්තුරු රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 50 | වෑල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 51 | බිම්මල් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 52 | ඉඩම් වෙන්දේසි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 53 | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 54 | ඉටිපන්දම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 55 | වාහන පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 56 | වාහන පිරිපහදු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 57 | පහන් තිර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 58 | වාහන ටෙන්ට් ගැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 59 | වාහන කර්ටන් ගැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 60 | පුළුන් ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**2024 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හෝ 150 වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තුවකට හෝ කර්මාන්ත බද්දකට යටත් නොවූ ව්‍යාපාර සහ කර්මාන්ත ස්වභායන් සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/87 දරණ තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

එකී ව්‍යාපාර බදු ගාස්තු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතුය. රජය මඟින් පනවා ඇති බදු මුදල් ද බලපත්‍ර ගාස්තු වලට අමතරව ගෙවිය යුතුය.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

" 1987අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි ii තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

## උප ලේඛනය

I වන කොටස:

**ව්‍යාපාර**

1. සිල්ලර වෙළඳ සැලක් පැවැත්වීම
2. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
3. සාප්පු බඩු අලෙවිසැලක් පැවැත්වීම
4. පාවහන් අලෙවි සැලක් පැවැත්වීම
5. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. ගොඩනැඟිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
8. තීන්ත, සායම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
9. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පැවැත්වීම
10. [illegible]
11. පරිගණක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම
12. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම
13. රියදුරු පුහුණුව සපයන ආයතනයක් පැවැත්වීම
14. සමුපකාර සමිති සිල්ලර කඩ (ප්‍රාදේශික) පැවැත්වීම
15. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
16. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
17. මූල්‍ය ආයතනයක් පැවැත්වීම
18. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
19. ලීසිං සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
20. [illegible]
21. ස්වර්ණාභරණ විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
22. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
23. ලී බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
24. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පැවැත්වීම
25. උත්සව භාණ්ඩ කුලියට දීම
26. ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම
27. [illegible]
28. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම

29. [illegible]

30. පින්තූර රාමු කිරිම හා වීදුරු කැපීමේ ස්ථානයක් පැවැත්වීම

31. වී මිලදී ගැනිමේ ස්ථානයක් පැවැත්වීම

32. සන්නිවේදන සේවා සැපයිමේ ආයතනයක් පැවැත්වීම

33. ජංගම දුරකථන අලෙවි කිරිමේ ස්ථානයක් පැවැත්වීම

34. රැකියා නියෝජිත ආයතනයක් පැවැත්වීම

35. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම

36. ලිපිද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පැවැත්වීම

37. ලී බඩු වෙළඳසැලක් පැවැත්වීම

38. පුවත්පත් විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

39. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

40. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම

41. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම

42. [illegible]

43. සිමෙන්ති විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

44. ප්‍රසිද්ධ සමාගම් වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම

45. වාහන අලෙවි කිරිමේ ස්ථානයක් පැවැත්වීම

46. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම

47. බුලත්, පුවක් විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

48. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටියක්) පවත්වාගෙන යාම

49. සත්ත්ව ආහාර විකිණිමේ ස්ථානයත් පවත්වාගෙන යාම

50. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණිමේ නියෝජිත ආයතනයක් පැවැත්වීම

51. භාවිතා කරන ලද වාහන විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම

52. භාවිතා කරන ලද මෝටර් සයිකල් විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

53. වෛද්‍යවරුන් හා රෝගීන් මුණගස්වන ආයතනයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම

54. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

55. තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

56. වාහන අමතර කොටස් විකිණිමේ ස්ථානයක් පැවැත්වීම

57. බලයලත් අරක්කු හා රට බිම විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම

58. බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම ( ෆාමසි)

59. කුළුබඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

60. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

61. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම

62. ජංගම වෙළඳ වාහනයක් හෝ ජංගම වෙළඳ සැලක් පවත්වාගෙන යාම

63. තේ කම්හලක් පැවැත්වීම

64. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

65. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

66. එළවළු පලතුරු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

67. තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම ( ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, පොහොර .....)

**II වන කොටස**

2023 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම

| **I තීරුව** | | **II තීරුව**<br>**රු.ශත** |
|---|---|---|
| i. | රු.6,000/- නොඉක්මවන විට | කිසිවක් නොමැත |
| ii. | රු.6,000/- ඉක්මවන නමුත් රු.12,000/- නොඉක්මවන විට | 90.00 |
| iii. | රු.12,000/- ඉක්මවන නමුත් රු.18,750/- නොඉක්මවන විට | 180.00 |
| iv. | රු.18,750/- ඉක්මවන නමුත් රු.75,000/- නොඉක්මවන විට | 360.00 |
| v. | රු.75,000/- ඉක්මවන නමුත් රු.150,000/- නොඉක්මවන විට | 1,200.00 |
| vi. | රු.150,000/- ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**2024 වර්ෂය සඳහා වාහන හා සතුන් සඳහා බදු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

තුළ වාහන හා සතුන් පිළිබඳ බද්දක්,ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තුවක්, අමාත්‍යවරයා විසින් අනුමත කොට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් ස්ථිර කරන ලද වෙනත් යම් ආකාරයක බද්දක්, හතර වන උපලේඛණයේ සඳහන් වුවද සාමාන්‍යයෙන් එම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සියළු වාහන සතුන් වෙනුවෙන් ඒ උපලේඛන යේ සඳහන් වූ අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2024 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/88 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳව බද්ද 2024 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල අය කිරිමට පනතේ 147 වැනි වගන්ති ප්‍රකාරව 148 (3) වගන්තිය යටතේ 2024 මාර්තු 31 දිනට පෙර අය කිරිමට තීරණය කරමි.

**උපලේඛනය**

| අනු අංකය | 1 වැනි තීරුව | 11 වන තීරුව |
|---|---|---|
| | වාහන හා සත්ත්ව බද්ද | රු.ශත |
| 01. | මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක් , රික්ෂෝවක්, කරත්තයක්, බයිසිකලයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම , | 25.00 |
| 02. | සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා (අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18.00 |
| | (ආ)වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් පාපැදි බලපත්‍ර ලියාපදිංචි | 4.00 |
| 03. | සෑම කරත්තයක් සඳහාම | 20.00 |
| 04. | සෑම අත්ට්‍රැක්ටරයක් සඳහාම | 10.00 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහාම | 7.50 |
| 06. | සෑම අශ්වයෙකු පෝනියෙකු හෝ එළුවෙකු සඳහාම | 15.00 |
| 07. | සෑම ඇතෙකු සඳහාම | 50.00 |

**<u>මීගහකිවුල ප්‍රාදේශීය සභාව</u>**

**<u>2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර සඳහා ගාස්තු පැනවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(I) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීථියකට,පාරකට,ඇළකට,වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් උප ලේඛනය සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අය කළ යුතු බව **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/89 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එකී බලපත්‍ර ගාස්තුව 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බැව් මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (අ) හා 122-126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල පරිදි සහ 1988.08.23 දින අංක 520/07 දරණ (iv) (අ) කොටස පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා සීමාව තුල කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් හෝ ඉදිකිරීමක ප්‍රදර්ශනය යම් විදියකට/පාරකට/ඇලකට/වැවකට/කුඹුරකට හෝ ඉඩමකට මුහුණ ලා තිබේ නම් උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2024.01.01 දින සිට අය කර ගැනීමට තීරණය කරමි.

| අනු අංකය | විස්තරය | මසක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව<br>රු.ශත |
|---|---|---|
| 01. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 45.00 |
| 02. | බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 125.00 |
| 03. | සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකටම | 50.00 |
| 04. | චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම | 20.00 |
| 05. | තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග අඩියකටම | 40.00 |
| 06. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා ලිත් වර්ෂයකට වර්ග අඩියකට අයකරනු ලබන මුදල | 200.00 |

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

1984 අංක 27 දරණ විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු අඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියට අනුව 2024 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුලත්වීම සඳහා අය කරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අය කරගැනීමට **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/90 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1984 අංක 27 දරණ විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු අඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුලත්වීම සඳහා අය කරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අය කරගැනීමට තීරණය කරමි.

තවද, ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පැනවෙන බලපත්‍ර ගාස්තුව පහත පරිදි අය කිරීමට තීරණය කරමි.

| **අනු අංකය** | **විස්තරය** | **රු. ශත** |
|---|---|---|
| 1. | දින 1 කට හෝ දින 7 නොඉක්මවන විට | 250.00 |
| 2. | දින 7 ඉක්මවන විට ඉන් වැඩි වන සෑම දිනකටම හෝ කොටසකටම | 50.00 |
| 3. | ජංගම විනෝද කටයුතු සඳහා | 1,500.00 |

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**1975/77 දරණ සමාජ ශාලා ආඥා පනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනත යටතේ ගාස්තු පැනවීම.**

1975/77 දරණ සමාජ ශාලා ආඥා පනත හා ප්‍රසිද්ධ රඟ දැක්විමේ ආඥා පනත යටතේ ගාස්තු පනවා අය කර ගැනීමට **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/91 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1975/77 දරණ සමාජ ශාලා ආඥා පනත හා ප්‍රසිද්ධ රඟ දැක්විමේ ආඥා පනත යටතේ 2024 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගාස්තු පනවා අයකිරීම පහත උපලේඛනයේ සඳහන් පරිදි සිදු කළ යුතු බව තීරණය කරමි.

| **අනු අංකය** | **විස්තරය** | **රු. ශත** |
|---|---|---|
| 1 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 50.00 |
| 2. | වාර්ෂික බලපත්‍ර ගාස්තු | 100.00 |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**2024 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම.**

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වශයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 2023 සැප්තැම්බර් මස 14 දින තීරණ අංක 2023/09/14/92 යටතේ පහත උපලේඛණයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31,ජූනි 30,සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 අවසන් වන සෑම කාර්තුවක් තුලදි සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබිය යුතු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂ සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ අක්කර බදු වශයෙන් සියයට දහයක් (10% ක් ) වට්ටමක්ද,ඒ එක් එක් කාර්තුවට අයත් අක්කර බදු ඒ ඒ කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුව හොත් සියයට පහක ( 5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

“ 1987අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශිය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවුද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවුද, ස්පීර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2024 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මීගහකිවුල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) □□Í□Í 1989 □□□□□□□Í 03 (අ) දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයිද මීගහකිවුල ප්‍රාදේශිය සභාව තීරණය කරන්නීය.”

(ඈ) එකී පනතේ 134 (07) වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි බදු මුදල් ගෙවනු ලබන ආකාරය අනුව වට්ටම් ප්‍රදානය කරනු ලබන බව ද වැඩි දුරටත් දන්වා සිටිමි.

මුළු වර්ෂයේම බදු මුදල ජනවාරි මස 31 වැනි දින ඉකුත් විමට මත්තෙන් ගෙවන්නේ නම් නියමිත බදු මුදලින් 10 % ක වට්ටමක් ලබා දෙනු ලබන බවටත්,

බදු මුදල කාර්තු වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක දී බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු වැනි මාසය තුල ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දිය යුතු බව තීරණය කරමි.

**<u>මීගහකිවුල ප්‍රාදේශීය සභාව</u>**
**<u>2024 වර්ෂය සඳහා කසල එක්රැස් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම.</u>**

1987/අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2012.10.05 වැනි දින අංක 1778/45 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) □□Í□Í □□□□Í □□□Í □□Í විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශිය සභා කොටසේ ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකල යුතු බව **1987 අංක15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 දින අංක 2023/09/14/93 දරණ තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,

සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (අ) හා 122-126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 2012.10.05 දින අංක 1778/45 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (iv) (අ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාත් ගරු ප්‍රධාන ඇමති තුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා කොටසේ ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකර ගැනීමට තීරණය කරමි.

| අනු අංකය | විස්තරය | රු.ශත |
|---|---|---|
| 01. | කරමැටිය මැලිබන් ඇහලුම් කර්මාන්ත ශාලාවේ කසල ඉවත් කිරීම සඳහා ට්‍රැක්ටරය රථය ලබා ගැනීමේ එක් අවස්ථාවක් සඳහා | 8,000.00 |
| 02. | කරමැටිය ප්‍රීමා පිටි කම්හලෙන් බැහැර කරන කසල 1Kg - 40Kg දක්වා | 1,250.00 |

- වැඩිවන සෑම 1Kg සඳහා පෙර වටිනාකම අනුපාතික වටිනාකමක් වශයෙන් ගාස්තු අය කෙරේ.(1250/40)

**<u>මීගහකිවුල ප්‍රාදේශීය සභාව</u>**

**<u>2024 වර්ෂයේ ජල ගාස්තු අය කිරීම</u>**

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් පාලන කරනු ලබන ජල ව්‍යාපෘති මගින් ජලය ලබා ගන්නා පාරිභෝගිකයන් වෙතින් පහත තීරණයේ සඳහන් ගාස්තු ප්‍රමාණයෙන් 2024 වර්ෂය සඳහා අය කිරිමට, **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/94 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන සම්මත ව්‍යවස්ථා පනතේ අංක 02 යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා විසින් සාදනු ලැබ 1988.08.23 දිනැති අංක 520/07 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පළ කරන ලද වූ පොදු අතුරු ව්‍යවස්ථා වල අංක 34 දරණ කාණ්ඩය වන ජල සම්පාදන පනතේ වූ අංක 40 සිට අංක 43 දක්වා වූ අතුරු ව්‍යවස්ථා වල සඳහන් පරිදි

පහත සඳහන් උපලේඛන 01 හා උපලේඛන 02 හි සදහන් අයුරින් හා අනෙකුත් ජල අයකිරීම් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජල සම්පාදන ක්‍රම වලින් 2024.01.01 වැනි දින සිට ජල ගාස්තු අය කර ගැනීමට තීරණය කරමි.

**උප ලේඛන අංක - 01 ගාස්තු අය කිරීම**

**මීගහකිවුල ජල යෝජනා ක්‍රමය**

| අනු අංකය | ගාස්තු ඒකක (ඝණ මීටර) | ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා | | ව්‍යාපාරික හා අනෙකුත් ආයතන සඳහා | |
|---|---|---|---|---|---|
| | | ස්ථාවර ගාස්තු | ඒකකයකට රුපියල් | ස්ථාවර ගාස්තු | ඒකකයකට රුපියල් |
| **01** | 0-5 දක්වා | 250.00 | 20.00 | 350.00 | 20.00 |
| **02** | 06 – 10 දක්වා | 300.00 | 20.00 | 400.00 | 20.00 |
| **03** | 11 – 15 දක්වා | 350.00 | 25.00 | 450.00 | 25.00 |
| **04** | 16 – 20 දක්වා | 400.00 | 30.00 | 500.00 | 30.00 |
| **05** | 21 – 25 දක්වා | 425.00 | 35.00 | 525.00 | 35.00 |
| **06** | 26 – 30 දක්වා | 450.00 | 40.00 | 550.00 | 40.00 |
| **07** | 31 – 35 දක්වා | 475.00 | 45.00 | 575.00 | 45.00 |
| **08** | 36 හෝ 36 න් ඉහළට | 500.00 | 50.00 | 600.00 | 50.00 |

**උප ලේඛන අංක - 02 ගාස්තු අය කිරීම**

**වෙලන්ලන්ද/තල්දෙන/කෙසෙල්වත්ත/කෝමාරික/10 කණුව/ලිහිණියාකැටිය/අරුකුඹුර ජල යෝජනා ක්‍රමය**

| අනු අංකය | ගාස්තු ඒකක (ඝණ මීටර) | ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා | | ව්‍යාපාරික හා අනෙකුත් ආයතන සඳහා | |
|---|---|---|---|---|---|
| | | ස්ථාවර ගාස්තු | ඒකකයකට රුපියල් | ස්ථාවර ගාස්තු | ඒකකයකට රුපියල් |
| **01** | 0– 10 දක්වා | 175.00 | 15.00 | 300.00 | 20.00 |
| **02** | 11 – 15 දක්වා | 225.00 | 20.00 | 300.00 | 25.00 |
| **03** | 16 – 20 දක්වා | 225.00 | 25.00 | 350.00 | 30.00 |
| **04** | 21 – 25 දක්වා | 250.00 | 30.00 | 350.00 | 35.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **05** | 26 – 30 දක්වා | 250.00 | 35.00 | 350.00 | 40.00 |
| **06** | 31 – 35 දක්වා | 250.00 | 40.00 | 350.00 | 45.00 |
| **07** | 36 හෝ 36 න් ඉහළට | 250.00 | 45.00 | 350.00 | 50.00 |

**ජල සේවා සඳහා ගාස්තු අයකිරීම්**

| අනු අංකය | විස්තරය | රු.ශත |
|---|---|---|
| 01 | ජල අයදුම්පතක් සඳහා ගාස්තු | 250.00 |
| 02. | ජල මීටරය සඳහා ගාස්තු | 7500.00 |
| 03. | නව ජල සම්බන්ධතාවය ලබා ගැනීමේදී තැම්පත් ගාස්තු | 5000.00 |
| 04. | ජල බදු ලේඛනයේ නම සංශෝධනය කිරිමේ අයදුම්පත් ගාස්තු | 300.00 |
| 05. | ගිවිසුම් කොන්දේසි උල්ලංගනය කර ඇති එක් අවස්ථාවක ගාස්තු අයකිරීම | 5000.00 |

**නව ජල සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා අය කරනු ලබන ගාස්තු**

| අනු අංකය | විස්තරය | රු.ශත |
|---|---|---|
| 01. | ගෘහස්ථ හා රාජ්‍ය ආයතන | 10,000.00 |
| 02. | ව්‍යාපාර | 12,000.00 |

*ජල මීටරය ලබා ගැනීම ප්‍රාදේශීය සභාව තුලින්ම ලබා ගත යුතුය.

*නව ජල සම්බන්ධතාව ලබා ගැනීමේදී ප්‍රධාන නලයේ සිට අදාල ස්ථානය දක්වා අවශ්‍ය ජල නල උපාංග (මීටරය රහිතව) පාරිභෝගිකයා විසින් සැපයිය යුතුය.එසේ නොවේ නම් සභාව විසින් ඉදිරිපත් කරන ඇස්තමේන්තු ගත මුදල පාරිභෝගිකයා විසින් ගෙවිය යුතුය.

**විසන්ධි කර ඇති ජල සම්බන්ධතා නැවත ලබා දීමේ ගාස්තු**

| අනු අංකය | විස්තරය | රු.ශත |
|---|---|---|
| 01. | නිවාස/රජයේ ආයතන | 3,000.00 |
| 02. | වෙනත් (ව්‍යාපාර) | 5,000.00 |

**පිරිපහදු කල ජලය සඳහා ගාස්තු අය කිරීම**

රු.ශත

- පිරිපහදු කල ජලය ලීටර් 01 ක් සඳහා 3.00

**මීගහකිවුල ප්‍රාදේශිය සභාව**

**2024 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අය කිරීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 21,49,78 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 දින අංක 520/07 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව,1987 **අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 දින අංක 2023/09/14/95 දරණ තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 21,49,78 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 දින අංක 520/07 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට තීරණය කරමි.

## උපලේඛනය

**01.මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය හා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම.**
**ඉදිකිරීම් සම්බන්ධ**

1.අයදුම්පත් ගාස්තුව රු. 300.00

2. පෙරසැරි ගාස්තුව

| | රු.ශත |
|---|---|
| ➢ නේවාසික ගොඩනැගිලි | 2,500.00 |
| ➢ වාණිජ හා වෙනත් ගොඩනැගිලි | |
| • කුඩා පරිමාණ | 5,500.00 |
| • මධ්‍ය පරිමාණ | 6,500.00 |
| • මහා පරිමාණ | 8,000.00 |

3. මායිම් තාප්ප/ ආරක්ෂක බැම් ඉදි කිරිම රු. 1,500.00

4.දුරකථන විදුලි සංදේශ කුළුණු රු. 10.000.00

**02.ගොඩනැගිලි ඉදිකිරීම/කොටසක් එකතු කිරීම/ගෙබිමේ විශාලත්වය පදිංචිය සඳහා වාණිජ හෝ වෙනත් නැවත ඉදි කිරීමක් සඳහා සංවර්ධන බලපත්‍ර වර්ග මීටර් වලින් භාවිත නිකුත් කිරීම රුපියල් ශත වලින්,**

| **ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්** | **පදිංචිය සඳහා රු. ශත** | **වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත** |
|---|---|---|
| 45ට අඩු | 600.00 | 2000.00 |
| 45-90 දක්වා | 1,600.00 | 2,500.00 |
| 91-180 දක්වා | 2,600.00 | 3,500.00 |
| 181-270 දක්වා | 3,600.00 | 4,500.00 |
| 271-450 දක්වා | 4,600.00 | 6,500.00 |
| 451-675 දක්වා | 5,600.00 | 8,500.00 |
| 676-900 දක්වා | 6,600.00 | 10,500.00 |
| 901-1225 දක්වා | 7,600.00 | 12,500.00 |

ව.මි 90 ක් වන එක් එක් අමතර ගෙබිම් ප්‍රමාණය රු. 1,000.00 බැගින් ව.මී. 90 ක් වන ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 1,500.00 බැගින්,

- . මායිම් තාප්ප/ ආරක්ෂක බැම් ඉදි කිරිම

| මායිම් තාප්පය ඉදිකිරිමේ සිමාව | මායිම් තාප්පයේ දිග මිටර් එකක් සඳහා ගාස්තුව | |
|---|---|---|
| | නේවාසික රු. | වාණිජ හා වෙනත් වර්ග රු. |
| ගොඩනැගිලි සිමාව පිටත | 40.00 | 50.00 |
| ගොඩනැගිලි සිමාව ඇතුලත | 60.00 | 70.00 |

- දුරකථන විදුලි සංදේශ කුළුණු

| | **පෙරසැරි ගාස්තු** | **රු.ශත** |
|---|---|---|
| | උස මීටර 0-20 දක්වා | 300,000.00 |
| | උස මීටර 20-50 දක්වා | 400,000.00 |
| | උස මීටර 50 ට වැඩි | 600,000.00 |
| | ආවරණ අනුමැතිය සඳහා ගාස්තු | |
| | උස සෑම මීටර් 5 කට | 20,000.00 බැගින් |

සංවර්ධන බලපත්‍ර අලුත් කිරිම - වර්ෂයකින් කාලය දිර්ඝ කිරිම රු.1000.00
(සංවර්ධන බලපත්‍රය වර්ෂයක් පාසා දිර්ඝ කළ යුතුය)

**03.නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම/කොටස් එකතු කිරීම/ නැවත ඉදිකිරීම සඳහා ආවරණ අනුමැතිය දීමේ ගාස්තු / මායිම් තාප්ප/ ආරක්ෂක බැමි ඉදි කිරිම හා දුරකථන විදුලි සංදේශන කුළුණු සඳහා ගාස්තු**

| | **නේවාසික වර්ග මීටර් 1 ක් සඳහා ගාස්තුව රු.ශත** | **වාණිජ හා වෙනත් ව.මී 1 ක් සඳහා රු.ශත** |
|---|---|---|
| 1.අත්තිවාරම් වැඩ පමණක් (කසීරු මට්ටම් සම්පූර්ණ කොට ඇති විට) | **200**.00 | 250.00 |
| 2. වහල මට්ටම දක්වා (වහලය රහිතව ඉදිකොට ඇති විට | **300**.00 | **350**.00 |
| 3. වහලය ඇතුළුව ඉදිකොට ඇති විට | **400**.00 | **450**.00 |
| 4. සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 5**00**.00 | **550**.00 |
| 5.මායිම් තාප්ප දිග 1m සඳහා | 30.00 | 60.00 |

6.දුරකතන විදුලි සංදේශන කුළුණු

| | |
|---|---|
| ➢ 0-30අතර | 100,000.00 |
| ➢ 30-60අතර | 150,000.00 |
| ➢ 60 වැඩි | 200,000.00 |

**04. අනුකූලතා සහතිකය ලබා ගැනීම සඳහා** රු.ශත

| | |
|---|---|
| • ගෘහස්ථ | 3000.00 |
| • වාණිජ | |
| ✓ කුඩා | 4,000.00 |
| ✓ මධ්‍යම | 6,000.00 |
| ✓ විශාල | 10,000.00 |
| අයදුම්පතක් සඳහා | 150.00 |

**05.පිඹුරුපත අනුමත කිරීමේ** රු.ශත

| | |
|---|---|
| අයදුම්පතක් සඳහා | 200.00 |
| පිඹුරුපත අනුමත කිරීමේ ගාස්තු | |
| ව.මී. 1000.00 අඩ ඉඩම් සඳහා | 2,500.00 |
| ව.මී 1001-5000 දක්වා | 5,200.00 |

| | |
|---|---|
| ව.මී. 5001-10000 දක්වා | 10,200.00 බැගින් |
| ව.මී. 10001 වැඩි සෑම ව.මී 1000 කටම | 1200.00 බැගින් |

**06. ඉඩම් අනුබෙදුම් කට්ටියක් අනුමත කිරිම සඳහා ගාස්තු** **රු.ශත**

අයදුම්පත් ගාස්තුව 200.00

**සංවර්ධන කාර්යයේ ස්වභාවය** **අය කල යුතු ගාස්තු**

බිම් කට්ටියක ප්‍රමාණය

| | | |
|---|---|---|
| i.ඉඩම් අනු කොටස් වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | | එක් බිම් කට්ටියකට අය කල යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර) |
| ii. ආවරණ අනුමැතිය සඳහා | ව.මී.150-300 අතර | 600.00 |
| | ව.මී 301-600 අතර | 500.00 |
| | ව.මී 601-900 අතර | 400.00 |
| | ව.මී 901 ට වැඩි | 300.00 |
| | එක් බිම් කොටසකට | 850.00 |

**රු.ශත**

**07.** වීථිරේඛා සහතිකය සඳහා 3000.00

අයදුම්පතක් සඳහා 150.00

**08.** නොපවරා ගැනීමේ සහතිකය සඳහා 1500.00

අයදුම්පතක් සඳහා 150.00

| 1ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා | | **රු.ශත** |
|---|---|---|
| | ව.මී150 ට අඩු ඉඩම් සඳහා | 2,600.00 |
| | ව.මී 151-300 දක්වා | 5,100.00 |
| | ව.මී 301 ට වැඩි වන සෑම ව.මී 150කටම | 3,100.00 |
| | ආවරණ අනුමැතිය සඳහා ගාස්තු | |
| | සෑම වර්ග මීටරයකටම | 5,500.00 බැගින් |

## මීගහකිවුල ප්‍රාදේශිය සභාව

**2024 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීම**

මීගහකිවුල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට අදාලව පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2024 වර්ෂය සඳහා ගාස්තු අයකරකිරීමට, **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/96 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1988 අංක 56 සහ 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත, 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1553/16 දරණ වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති ගැසට් පත්‍රයේ (ඇ) උපලේඛනයෙන් හා 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරණ ගැසට් පත්‍රයේ හා 2264/18 දරණ වර්ෂ 2022 ක් වූ ජනවාරි 27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ (ඇ) කොටසේ සඳහන් පරිදි පැවරී ඇති බලය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රෙදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා එකවර වසර 03 ක කාල පරිච්ඡේදයක් සඳහා රු. 4,500.00 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට තීරණය කරමි.

එසේම පරිසර බලපත්‍ර සඳහා වන පරීක්ෂණ ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.

| **මූලික ආයෝජනය** | **පරීක්ෂණ ගාස්තු**<br>**රු. ශත** |
|---|---|
| රු.250,000.00 දක්වා | 3,000.00 |
| රු. 250,001.00 - රු. 500,000.00 දක්වා | 3,750.00 |
| රු. 500,001.00 - රු 1,000,000.00 දක්වා | 5,000.00 |
| රු. 1,000,000.00 ට වැඩි | 10,000.00 |
| අයදුම්පත් ගාස්තු | 200.00 |

# මීගහකිවුල ප්‍රාදේශිය සභාව

## 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මීගහකිවුල ප්‍රාදේශිය සභා බල සීමාව තුල ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි 2024 වර්ෂය සඳහා ගාස්තු අයකරකිරීමට, **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/97 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,

සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 153 (1) වැනි වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බල තල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක

1) එම ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,

2) එම ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

3) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ

ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති ප්‍රමාණය 1/20 ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීම සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.1% ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි තීරණය කරමි.

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම සම්බන්ධයෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2024 වර්ෂය සඳහා ගාස්තු අයකරකිරීමට, **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/98 දරණ තීරණය මඟින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

2024 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශිය සභාව සතු පහත උපලේඛනයේ සඳහන් වාහන යන්ත්‍රෝපකරණ සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරිමට තීරණය කරමි.

## උප ලේඛණය

**වාහන කුලිය සඳහා ගාස්තු**

| අනු අංකය | වාහනය/යන්ත්‍රය | මිළ (රු.ශත)<br>(දිනකට/පැයකට/දින1/2) | රැඳවුම් ගාස්තුව |
|---|---|---|---|
| 01. | බැකෝ ලෝඩරය | ඉන්ධන සහිතව පැයකට රු.5,800.00<br>ඉන්ධන රහිතව පැයකට රු.3,300.00 | දිනකට රු.5,800.00 |
| 02. | ටොන් 08 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට රු.5,100.00<br>ඉන්ධන රහිතව පැයකට රු.2,000.00 | දිනකට රු5,100.00 |
| 03. | ටොන් 02 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට රු.3,000.00<br>ඉන්ධන රහිතව පැයකට රු.1,300.00 | දිනකට රු.3,000.00 |
| 04. | ට්‍රැක්ටරය රථය | ඉන්ධන සහිතව දිනකට රු.11,650.00<br>ඉන්ධන රහිතව දිනකට රු. 4,300.00 | දිනකට රු.2,500.00 |
| | ට්‍රැක්ටරය රථය දින ½ සඳහා (පැය 04 ක්) | ඉන්ධන සහිතව රු.5,825.00<br>ඉන්ධන රහිතව රු. 2,150.00 | |
| 05. | ජල බවුසරය . ට්‍රැක්ටරය සහිතව | ජලය රහිතව 5km ඇතුළත එක් වරකට රු.1,300.00<br>ජලය සහිතව 5km ඇතුළත එක් වරකට රු.4500.00<br>වැඩිවන අමතර1 km සඳහා රු .200.00 | 1000.00 (ට්‍රැක්ටරය රහිතව) |
| | ජල බවුසරය (ට්‍රැක්ටරය රහිතව)<br>ටේලරය (ට්‍රැක්ටරය රහිතව) | ඉන්ධන රහිතව දිනකට රු.2,000.00 (ව්‍යාපෘති සඳහා) | |
| 06. | ටිපර් රථය | ඉන්ධන සහිතව දිනකට රු.23,500.00<br>(උපරිම 70km )වැඩිවන අමතර 1 km සඳහා රු.270.00<br>ඉන්ධන රහිතව දිනකට රු.9,000.00 (උපරිම70 km ) වැඩිවන අමතර 1 km සඳහා රු.55.00 | - |
| 07 | පස් තලන යන්ත්‍රය | ඉන්ධන රහිතව දිනකට රු.5,000.00 (යන්ත්‍ර ක්‍රියාකරු සමඟ) | |

| | | | |
|---|---|---|---|
| | | ඉන්ධන රහිතව දින ½ සඳහා (පැය 04ක්) (යන්ත්‍ර ක්‍රියාකරු සමඟ) රු.2,500.00 | |

(ඉන්ධන මිල විචලනයක් සිදු වුව හොත් ඉහත ගාස්තු සංශෝධනය කිරීම සභාව සතුවේ.)

## <u>මීගහකිවුල ප්‍රාදේශීය සභාව</u>

## <u>2024 වර්ෂය සඳහා සහතික පත් හා වෙනත් සේවා ගාස්තු අය කිරීම.</u>

මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2024.01.01 වැනි දින සිට අයකරනු ලබන බව **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,** 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වන දින අංක 2023/09/14/99 දරණ තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්.කේ.ඩී.දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස........ වැනි දින
මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### තීරණය

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලබන සේවාවන්හි දී 2024 වර්ෂයේ දී නිකුත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර, සහතික, දැන්වීම් හා අවසර පත්‍ර සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පහත සඳහන් ආකාරයට අය විය යුතු බව තීරණය කරමි.

### උපලේඛනය

| වර්ගය | ගාස්තුව (රු.ශත) |
|---|---|
| <u>පුස්තකාල</u> | |
| 01.පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50.00 |
| 02.පුස්තකාල සාමාජික ගාස්තුව (නව අයදුම්කරුවකු සඳහා) | |
| • අවුරුදු 6 සිට 12 දක්වා ළමුන් සඳහා | 100.00 |
| • අවුරුදු 12 සිට වැඩිහිටි ළමුන් සඳහා | 200.00 |
| • වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාව තුළ පදිංචි) | 250.00 |
| • වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාවෙන් පිටත පදිංචි) | 300.00 |
| 03.පුස්තකාල දඩ (දිනකට) | 5.00 |

04. පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම (වාර්ෂික)

- පාසැල් සිසුන් 100.00
- වැඩිහිටියන් 150.00

<u>පෙර පාසල්</u>

රු.ශත

01.පෙර පාසල සඳහා ඇතුලත් වීමේ අයදුම්පත් ගාස්තු 100.00

02. පෙර පාසල සඳහා ළමුන් ඇතුලත් වීමේ ගාස්තු 1,000.00

## <u>වෙනත්</u>

රු.ශත

01.අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා නගර සීමාව භාවිතා කිරීම 3,000.00

02. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්,පොදු රැස්වීම් හා වෙනත් සඳහා මීගහකිවුල සතිපොළ ගොඩනැගිල්ලේ රු.ශත

උඩු මහල සඳහා 4,000.00

බිම් මහල සඳහා 3,500.00

03. කරමැටිය පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා ඉඩම වෙන් කරගැනීම සඳහා 4,000.00

04. තල්දෙන පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහාන ඉඩම වෙන් කරගැනීම සඳහා 4,000.00

05.නව බස් නැවතුම්පල භූමිය කුලියට දීම. - සහාව සතු භූමියක වර්ග අඩියක් සඳහා එක් දිනකට රු.5/-

06. ජංගම වෙළඳාම බල ප්‍රදේශය තුල (දෛනිකව)

| විස්තරය | ලොරි රථ (රු.ශත) | ත්‍රිරෝද රථ/මෝටර් බයිසිකල් (රු.ශත) | වෙනත් (රු.ශත) |
|---|---|---|---|
| මස්/මාළු සඳහා | 500.00 | 150.00 | 200.00 |
| එළවලු/කුළුබඩු සඳහා | 250.00 | 100.00 | 150.00 |
| බේකරි නිශ්පාදන | 250.00 | 150.00 | 100.00 |

07.රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම

රු.ශත

- ත්‍රිරෝද රථ සඳහා 40.00
- වෑන් රථ/කාර් රථ සඳහා 50.00

- බස් රථ/ලොරි රථ සඳහා 100.00
- වෙනත් 60.00

**08.පිටමාරුව පුංචි ලෝකාන්තය නැරඹීම සඳහා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම.**

- සියළුම සංචාරකයින් සඳහා රු.50.00

- **කූඩාරම, ලන්තෑරුම හා BBQ Machine එක (එක් රාත්‍රියක් සඳහා) රු.ශත**

  - ✓ පුද්ගලයින් 04 ක් සඳහා කූඩාරම(Double Layer auto) 750.00
  - ✓ පුද්ගලයින් 06 ක් සඳහා කූඩාරම (Double Layer auto) 1,000.00
  - ✓ පුද්ගලයින් 4ක් සඳහා කූඩාරම , ලන්තෑරුම(භූමිතෙල් රහිතව) සමඟ BBQ Machine (ලොකු) 1100.00
  - ✓ පුද්ගලයින් 6ක් සඳහා කූඩාරම , ලන්තෑරුම(භූමිතෙල් රහිතව) සමඟ BBQ Machine (ලොකු) 1300.00
  - ✓ BBQ Machine (ලොකු ) 300.00

<u>**නිෂ්පාදනය හා ප්‍රවාහනය මත ගාස්තු අය කිරීම**</u>

01.කළුගල් හා හුණුගල් කැඩීම වෙනුවෙන් සෑම
කියුබ් 01 ක් සඳහාම 100.00

02. තිරුවානා ගල් කැඩීම වෙනුවෙන් සෑම
කියුබ් 01 ක් සඳහාම 150.00

03. කුඩා විදුලි බලාගාර වල නිෂ්පාදනය කරනු ලබන විදුලි ඒකක
01 ක් සඳහා (ප්‍රධාන විදුලි පද්ධිතියට එක් කරන) 0.25

04.මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රද්ශයේ වැලි වලකින් ගොඩ
දමන වැලි කියුබ් 01 ක් සඳහා 40.00

05. වැලි වලේ සිට ප්‍රවාහනය කරන වැලි කියුබ් 01 ක් සඳහා 60.00